## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාව

## බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1990 අංක 05 දරණ අධ්‍යාපන ප්‍රඥප්තිය

## 1990 අංක 05 දරණ බස්නාහිර පළාතේ අධ්‍යාපන ප්‍රඥප්තිය

## THE EDUCATIONAL STATUTE NO. 05 OF 1990 OF THE PROVINCIAL COUNCIL OF THE WESTERN PROVINCE

අධ්‍යාපනය සහ අධ්‍යාපනික පහසුකම් සඳහා වන හොඳ ප්‍රතිපාදන සැලැස්වීම පිණිස සහ ඊට සම්බන්ධ හා ආනුෂංගික කරුණු සඳහා විධි විධාන සැලැස්වීම සඳහා වූ ප්‍රඥප්තියකි. මේ ප්‍රඥප්තිය (185 වන අධිකාරිය වූ) අධ්‍යාපන ආඥාපනතට අනුකූල නොවන අවස්ථාවක, මෙම ප්‍රඥප්තියේ ප්‍රතිපාදන බලපවත්වනු ඇත.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මේ ප්‍රඥප්තිය ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1990 අංක 05 දරණ අධ්‍යාපන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, ආණ්ඩුකාරවරුන්ගේ අනුමැතිය ලැබූ දිනක සිට එය ක්‍රියාත්මක වන්නේය.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය

### 1 වන කොටස

### පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

2. (1) මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා (මෙහි මින් මතු ,අධ්‍යාපන අධ්‍යක්ෂ, යනුවෙන් සඳහන් කරනු ලබන) යන අනෙක් නිලධාරීන් හා රාජ්‍ය සේවකයන්ගෙන් සමන්විත වූ අධ්‍යාපන දෙපාර්තමේන්තුවක් පිහිටුවනු ලැබිය යුතුය.

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

(2) අමාත්‍යවරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධි විධානවලට යටත්ව, ලේකම්වරයා මේ ප්‍රඥප්තිය පරිපාලනය කිරීම භාරව සිටිය යුතුය.

3. මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා පහත සඳහන් තැනැත්තන් පත් කරනු ලැබිය හැකිය.

(1) අතිරේක අධ්‍යාපන අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ සහ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ.

(2) අමාත්‍යවරයාගේ සාමාන්‍ය විධානයට සහ පාලනයට යටත්ව, ලේකම්වරයා, අධ්‍යක්ෂවරයා සහ වෙනත් නිලධරයන් විසින් මේ ප්‍රඥපතියේ සහ ඒ යටතේ සාදනු ලැබූ නියෝගවල විධි විධාන ක්‍රියාත්මක කළ යුතු අතර, ඒ විධි විධාන බලාත්මක කිරීමේ බලය ඔවුන් සතු වේ.

(3) මේ ප්‍රඥප්තියේ හෝ ඒ යටතේ සාදනු ලැබූ නියෝගවල හා විධි විධානයන් යටතේ තමන්ගේ අභිමතය පාවිච්චි කරමින් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් කරනු ලැබූ යම් නියමයක් හෝ තීරණයක් ඒ සම්බන්ධයෙන් අභියාචනයක් කරනු ලැබූ විට හෝ එසේ නොමැතිව අමාත්‍යවරයා විසින් පරිච්ඡින්න කිරීම හෝ වෙනස් කිරීම නීත්‍යනුකූල වන්නේය. එවැනි හැම අවස්ථාවකදීම.

## 2 වන කොටස

## පහසුකම් ගාස්තු හා පාසල් මණ්ඩල

4. (1) බස්නාහිර පළාතේ රජයේ පාසලකට හෝ රජයේ මූල්‍ය ආධාර දෙන පාසලකට ශිෂ්‍යයන් ඇතුළත් කිරීම සඳහා හෝ එවැනි පාසලකින් අධ්‍යාපනය ලබාදීම සඳහා කිසිදු ගාස්තුවක් අය නොකරනු ලැබිය යුතුය.

රජයේ හා ආධාර ලබන පාසල්වල පහසුකම් ගාස්තු අයකිරීම හා ඒ පාසල්වලට ළමුන් ඇතුළත් කිරීමට හා ඉගෙනීමට මුදල් අයකිරීම තහනම් බව

(2) වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව තිබුණද, බස්නාහිර පළාත තුළ පිහිටි යම් රජයේ පාසලක හෝ රජයේ අරමුදල්වලින් මූල්‍ය ආධාර ලබන යම් පාසලක ක්‍රීඩා හෝ ශාරීරිකාභ්‍යාස හෝ අධ්‍යාපනික විනෝද ක්‍රීඩා නැතහොත් සෞඛ්‍ය සේවා සැපයීමේ කාර්ය සඳහා කරනු ලබන වියදම් පියවීම පිණිස ,පහසුකම් සහ සේවා ගාස්තු, යනුවෙන් හඳුන්වනු

ලබන ගාස්තුවක් හෝ ගාස්තු එවැනි පාසල්වල ඉගෙනගන්නා ශිෂ්‍යයන්ගෙන් අයකරනු ලැබිය හැකිය.

(3) එවැනි පාසලක් විසින් අය කරනු ලබන එවැනි ගාස්තුවක ප්‍රමාණය, ඒ පාසලෙන් සපයනු ලබන සේවා සහ පහසුකම් සැලකිල්ලට ගෙන අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන මුදල් ප්‍රමාණයට වැඩි නොවිය යුතුය.

(4) පහසුකම් සහ සේවා ගාස්තු ගෙවීමට ශිෂ්‍යයන්ට නොහැකිවීම හේතු කොටගෙන පාසලට ඇතුළත් කිරීම හෝ පැමිණීම සම්බන්ධයෙන් ශිෂ්‍යයන්ට දඬුවම් කිරීම වළක්වාදීම සඳහා අවශ්‍ය පියවර එවැනි ගාස්තු අය කරන සෑම පාසලකම විදුහල්පතිවරුන් විසින් කළ යුතුය.

පහසුකම් ගාස්තු නොගෙවීම හේතු කොටගෙන ශිෂ්‍යයන්ට දඬුවම් නොකළ යුතු බව.

5. බස්නාහිර පළාතේ සෑම පාසලකම පාසල් ප්‍රධානියා නැතහොත් විදුහල්පතිට පාසල් සංවර්ධනය කිරීම උදෙසා උපදෙස් දීමට හා සහායවීමට මණ්ඩලයක් පත් කරනු ඇත.

පාසල් මණ්ඩල

එසේ වුවද, මෙම මණ්ඩලය පාසලේ විදුහල්පතිගේ අභ්‍යන්තර පරිපාලන කටයුතුවලට අවහිරවන කටයුතු නොකරනු ඇත. පාසලේ විදුහල්පතිගේ පරිපාලන කටයුතු යටපත් වන පරිදි කටයුතු කිරීම හෝ පාසලේ ගුරුවරයකුගේ තත්ත්වය පහත හෙලන කටයුතු කිරීම හෝ මෙම මණ්ඩලයේ කාර්‍යාවලියට ඇතුළත් නොවනු ඇත.

6. (1) පාසල් මණ්ඩලවල සාමාජිකත්වය පහත සඳහන් පරිදි සකස් විය යුතුය.

පාසල් මණ්ඩලයේ සාමාජිකත්වය

(i) පාසලේ ඉගෙනුම ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ දෙමාපියන් හෝ භාරකරුවන් අතුරෙන් අවම වශයෙන් නියෝජිතයින් දෙදෙනකු (පාසලේ ශිෂ්‍ය සංඛ්‍යාව 500 දෙනෙකුට වැඩි වන අවස්ථාවලදී එසේ වැඩිවන ශිෂ්‍යයින් 500 දෙනෙකුට එක් අතිරේක නියෝජිතයකු බැගින්ද විය යුතුය.)

(ii) පාසලේ ඉගැන්වීම කරන ගුරුවරුන් අවම වශයෙන් දෙදෙනකු (විවිධ අංශ නියෝජනය වන පරිදි)

(iii) ආදි ශිෂ්‍ය ශිෂ්‍යා සංගමයේ නියෝජිතයන් දෙදෙනකු

(iv) පාසලේ සුබසිද්ධිය පතන්නන් අතුරෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පත් කරනු ලබන නියෝජිතයන් දෙදෙනකු.

(2) නිලබලයෙන් විදුහල්පති පාසල් මණ්ඩලයේ සභාපති ලෙස කටයුතු කරනු ඇත.

(3) පාසලේ බහුතර ශිෂ්‍ය සංඛ්‍යාව අදහනු ලබන ආගමේ පූජකතුමකු/තුමියක අනුශාසකවරයකු ලෙස පත් කරගත හැක.

7. පාසල් මණ්ඩලයේ ප්‍රධාන වගකීම්. මණ්ඩලයේ කාර්යයන් හා වගකීම්

(1) පළාතේ අධ්‍යාපන ප්‍රතිපත්තිය ගැන අවබෝධයක් සාමාජිකයන්ට ලබාදී දැනුවත් කිරීම

(2) පාසල් වත්ත, ගොඩනැගිලි, ක්‍රීඩාපිටිය හා උපකරණ පුනරුත්ථාපනයට උපකාර කිරීම

(3) පාසලේ අවශ්‍යතා සොයා බලා සම්පත් ආයෝජනයට උපදෙස් දීම.

(4) පාසල් දරුවන්ට දිවා භෝජනය ලබාදීමට අවශ්‍ය ආධාර ලබාදීම.

(5) පාසල් දරුවන්ගේ කලට වේලාවට පාසල් ඒම හා නොකඩවා පාසල් පැමිණීම පිළිබඳ වගබලා ගැනීම.

(6) පාසලේ බාහිර සම්පත් උපයා ගැනීම හා මෙම සම්පත්වලින් උපරිම මෙහෙයක් ලබා ගැනීම.

(7) පාසල් හැරයන දරුවන්ට වෘත්තිය කාර්මික රැකියා නැඹුරු පුහුණු මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම හා පවත්වාගෙන යෑම උදෙසා උදව්දීම.

8. (1) සුවිශේෂ ව්‍යාපෘතීන්ට හා සාමාන්‍ය කාර්යයන් උදෙසා පාසල් මණ්ඩලයට පාසලේ ප්‍රගතිය පතන්නන්ගෙන් ආධාර ලබාගත හැක. අධ්‍යාපන

අධ්‍යක්ෂගේ අනුමැතිය ඇතිව මෙම මුදල් අභිමත පාසල් සංවර්ධන කාර්යයන්ට මණ්ඩලයට වැය කළ හැක. මේ වැය පිළිබඳ ගිණුම් හා රිසිට්පත් තබාගත යුතු අතර, ඒවා ඕනෑම විටක දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ පරීක්ෂණයට යොමු කළ යුතුය. මෙම ගිණුම් පරීක්ෂා කර අනුමත කිරීම වාර්ෂික පරීක්ෂණයකදී කළ යුතු කර්යයකි.

## 3 වන කොටස

## පාඨශාලාවල ආගම පිළිබඳ කරුණු සහ කළමනාකාරවරු

10. (1) යම් පාසලකට ඇතුළත්වීමට අපේක්ෂා කරන අයදුම්කරුවකු හෝ ඔහුගේ මවුපියන්ගෙන් කෙනෙකුගේ ආගම, ජාතිය, ජාතිකත්වය, කුලය, සමාජ තත්ත්වය හෝ භාෂාව හේතු කොටගෙන ඔහු පාසලට ඇතුළත් කරනු ලැබීම ප්‍රතික්ෂේප නොකළ යුතුය.

ආගම ආදිය පාසල්වලට ළමුන් ඇතුළත් කිරීම සඳහා බාධකයක් නොවන බව

(2) (I) මෙහි මතු දක්වා ඇති විධි විධාන යටත්ව රජයේ පාසලක ඉගෙන ගන්නා සෑම ශිෂ්‍යයකුටම ඔහුගේ පාසල් අධ්‍යාපනයේ කොටසක් වශයෙන් ඔහුගේ දෙමව්පියන්ගේ ආගම අධ්‍යක්ෂවරයා විසින් අනුමත කරනු ලබන්නා වූද එම ආගම අදහන්නන්ටද තැනැත්තකු ලවා ඉගැන්විය යුතුය.

ආගම ඉගැන්වීම

එසේ වුවද -

(අ) යම් ආගමකට අයත් දෙමව්පියන්ගේ දරුවන් වන ශිෂ්‍යයන්ගේ සංඛ්‍යාව 15 කට වඩා අඩු නම් ඒ ආගම ඒ පාසලේ ඉගැන්වීම අවශ්‍ය නොවේ.

(ආ) යම් ශිෂ්‍යයකුගේ දෙමව්පියන්ගේ ආගමට අයත් ආයතනයකට හෝ පූජනීය ස්ථානයකට හෝ ඒ ආගම පිළිපදින ස්ථානයකට යාමෙන් තම දරුවන් නිදහස් කරන ලෙස යම් දෙමවුපියෙක් ස්වේච්ඡාවෙන්ම විදුහල්පතිවරයා වෙත ලිඛිත ඉල්ලීමක් කරනු ලැබුවහොත් එවැනි ශිෂ්‍යයකු

එවැනි ආයතනයකට හෝ පූජනීය ස්ථානයකට හෝ ආගම පිළිපදින ස්ථානයකට යැවීමට විදුහල්පතිවරයා විසින් නියම නොකළ යුතුය. නැතහොත් ඉඩ නොදිය යුතුය.

(II) යම් ශිෂ්‍යයයකුගේ දෙමව්පියන්ගේ ආගම නොවන ආගමකට අයත්, පාසලේදී හෝ පාසලේ යම් නේවාසිකාගාරයකදී හෝ පාසල් භූමියේ පිහිටි යම් ශිෂ්‍යයකුගේ දෙමවුපියන්ගේ ආගම නොවන ආගමක් පිළිබඳ ඒ ශිෂ්‍යයාට ඉගැන්වීම හෝ ඒ ආගම ඇදහීමට හෝ පිළිපැදීමට එවැනි ශිෂ්‍යයකුට නියම කිරීම හෝ ඊට ඉඩදීම පාසලක විදුහල්පතිවරයා විසින් හෝ පාසල භාරව සිටින තැනැත්තන් විසින් නොකළ යුතුය.

(III) යම් පාසලක යම් රැස්වීමක් සම්බන්ධයෙන් කරනු ලබන යම් ආගමික ඇදහීමක් හෝ පිළිපැදීමක් ඒ රැස්වීම ආරම්භයේදී හෝ අවසානයේදී ආරම්භයේදී සහ අවසානයේදී යන දෙකෙහිදීම හෝ විය යුතු අතර, ඒ පාසලේ ආගම ඉගැන්වීමේ කාලය අධ්‍යක්ෂවරයා විසින් අනුමත කරනු ලැබූද, සෑම පන්ති කාමරයකට ස්ථිරව හෝ පැහැදිලිව ප්‍රදර්ශනය කරනු ලබන්නා වූද, කාලසටහනක නිශ්චිතව දක්වා තිබිය යුතුය.

(IV) මේ වගන්තියේ කාර්ය සඳහා :-

(අ) දෙමව්පියන් යන්නට 36 වන වගන්තියේදී ඇති අර්ථ කථනය අදාළ නොවේ.

(ආ) දෙමව්පියන්ගේ හෝ ශිෂ්‍යයකුගේ ආගම පහත දැක්වෙන විධි විධානවලට අනුකූලව තීරණය කරනු ලබිය

යුතුය.

i ශිෂ්‍යයකුගේ පියා මනා සිහි බුද්ධියෙන් සිටිමින් තම ආගම පිළිබඳ ප්‍රකාශයක් කර ඇති අවස්ථාවකදී ඒ ආගම ඒ ශිෂ්‍යයාගේ ආගම වශයෙන් තීරණය කරනු ලැබිය යුතුය.

ii ඉහත (1) වන ඡේදයේ සඳහන් පරිදි ප්‍රකාශයක් ඉදිරිපත් කර නොමැති අවස්ථාවකදී ශිෂ්‍යයාගේ මව මනා සිහි කල්පනාවෙන් සිටීමත් තමාගේ ආගම ගැන කරනු ලබන ප්‍රකාශයක සඳහන් ආගම ශිෂ්‍යයාගේ දෙමවුපියන්ගේ ආගම වශයෙන් සලකනු ලැබිය යුතුය.

iii ඉහත (1) වන සහ (II) වන ඡේදවල සඳහන් අවස්ථා හැර වෙනත් යම් අවස්ථාවක දී ශිෂ්‍යයාගේ නීත්‍යානුකුල භාරකාරත්වය දරණ යම් තැනැත්තකු විසින් ශිෂ්‍යයාගේ ආගම ලෙස ප්‍රකාශ කරනු ලබන ආගම ශිෂ්‍යයාගේ දෙමවුපියන්ගේ ආගම වශයෙන් සලකනු ලැබිය යුතුය.

(V) රජයේ අරමුදලින් මුලාධාර ලැබෙන යම් පාසලක් සම්බන්ධයෙන් වන විට, මේ වගන්තියේ විධි විධානවලින් කිසිවක් කඩ කරනු ලැබූ අවස්ථාවකදී, ඒ පාසලේ කළමනාකරු වෙත පළාත් අරමුදලින් ගෙවනු ලබන යම් ආධාර මුදලක් නවැත්වීම හෝ එය ගෙවීමට ප්‍රතික්ෂේප කිරීම හෝ ඒ පාසල ලියාපදිංචි කළ පාසල් ලැයිස්තුවෙන් ඉවත් කිරීම හෝ අධ්‍යක්ෂවරයා විසින් කරනු ලැබිය යුතුය. ආධාර නොලබන හෝ අනුමත කළ හෝ පිළිගනු ලැබූ පාසලක් ලෙස ලියාපදිංචි කරනු ලැබූ වෙනත් යම් පාසලක් සම්බන්ධයෙන් වන විට, මේ වගන්තියේ විධි විධාන කිසිවක් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් ඒ පාසලේ ලියාපදිංචිය, අනුමත කිරීම හෝ පිළිගැනීම ඉවත් කරනු ලැබිය හැකිය.

(3) (1) රජයේ අරමුදලින් මූල්‍යාධාර ලබන යම් පාසලක හෝ ආධාර නොලබන පාසලක් වශයෙන් ලියාපදිංචි කරනු ලැබූ හෝ අනුමත කරනු ලැබූ හෝ පිළිගනු ලැබූ බස්නාහිර පළාතේ යම් පාසලක අයිතිකරුවන් විසින් ලිඛිතව නිර්දේශ කරනු ලබන යම් තැනැත්තකු ඒ පාසලේ කළමනාකරු වශයෙන් අධ්‍යක්ෂවරයා විසින් පත්කරනු ලැබිය හැකිය.

ආධාර ලබන පාසල්වල කළමනාකාරවරු

(2) එවැනි පාසලක කළමනාකරු වශයෙන් පත් කිරීමට එහි අයිතිකරු විසින් නිර්දේශ කරනු ලැබූ තැනැත්තා ඒ පාසලේ කළමනාකරු වශයෙන් පත් කිරීම අධ්‍යක්ෂවරයා විසින් ලිඛිතව හේතු දක්වා අයිතිකරු වෙත යවනු ලබන ලිපියක් මගින් ප්‍රතික්ෂේප කිරීමේදී ඒ තැනැත්තා වෙනුවට කළමනාකරු වශයෙන් වෙනත් තැනැත්තකු නිර්දේශ කරන ලෙස අයිතිකරුගෙන් ඉල්ලා සිටිය හැකිය.

(3) එවැනි යම් ආධාර ලබන පාසලක හෝ ලියාපදිංචි කළ ආධාර නොලබන පාසලක කළමනාකරු වශයෙන් පත් කිරීමට සුදුසු තැනැත්තකු යැයි අධ්‍යක්ෂවරයාට පෙනී යන තැනැත්තකු නිර්දේශ කිරීම ඒ පාසලේ අයිතිකරු ප්‍රතික්ෂේප කරන හෝ නොසලකා හරින හෝ අපොහොසත් වන අවස්ථාවකදී අධ්‍යක්ෂවරයාගේ අභිමතය අනුව සුදුසු යැයි සලකනු ලබන තැනැත්තකු ඒ පාසලේ කළමනාකරු වශයෙන් අධ්‍යක්ෂවරයා විසින් පත් කරනු ලැබීම නීත්‍යනුකූල වන්නේය.

(4) මෙහි මින් මතු 'කළමනාකරු' යනුවෙන් සඳහන් කරනු ලබන යම් පාසලක කළමනාකරුවකුගේ ධුරය, අධ්‍යක්ෂවරයාගේ

කැමැත්තපරිදි හෝ පාසලේ කළමනාකරු විසින් ලිඛිතව ඉල්ලීමක් කරනු ලැබූ විට, තාවකාලිකව අත්හිටුවීම හෝ ඔහු ධූරයෙන් ඉවත් කිරීම හෝ අධ්‍යක්ෂවරයා විසින් කරනු ලැබිය හැකිය.

(5) යම් ආධාර ලබන පාසලක කළමනාකරුගේ ධූරය තාවකාලිකව අත්හිටුවීම හෝ ඔහු ධූරයෙන් ඉවත් කිරීම සඳහා ලිඛිත ඉල්ලීමක් ඒ පාසලේ අයිතිකරු විසින් අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කරනු ලැබූ විටක, තම තීරණය පිළිබඳ ලිඛිත හේතු එකී අයිතිකරු වෙත දැනුම් දෙමින් අධ්‍යක්ෂවරයා විසින් එකී ඉල්ලීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය.

(6) අධ්‍යක්ෂවරයාගේ කැමැත්ත අනුව කළමනාකාර ධූරය අත්හිටුවනු ලැබූ හෝ ඒ ධූරයෙන් ඉවත් කරනු ලැබූ යම් තැනැත්තකු විසින් එසේ ධූරය අත්හිටුවීමට හෝ ධූරයෙන් ඉවත් කරනු ලැබීමට එරෙහිව අභියාචනයක් අමාත්‍යවරයා වෙත කරනු ලැබිය හැකිය. මේ උපවගන්තිය යටතේ කරනු ලැබූ යම් අභියාචනයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ තීරණය අවසානාත්මක සහ තීරණාත්මක වන්නේය.

(7) යම් පාසලක අයිතිකරු විසින් ඒ පාසලේ කළමනාකරු වශයෙන් පත් කිරීමට නිර්දේශ කරන ලද තනැත්තා එසේ කළමනාකරු වශයෙන් පත් කිරීමට ප්‍රතික්ෂේප කරමින් හෝ අයිතිකරු විසින් නිර්දේශ කරන ලද තැනැත්තා නොවන වෙනත් යම් තනැත්තකු කළමනාකරු වශයෙන් පත් කරමින් හෝ අයිතිකරුගේ නිර්දේශය මත පත් කරන ලද කළමනාකරුගේ ධූරය අත්හිටුවන ලෙස හෝ ධූරයෙන් ඉවත් කරන අයිතිකරු විසින් ඉල්ලා සිටි පරිදි කළමනාකරුගේ ධූරය අත්හිටුවීම නැතහොත්

ඔහු ධුරයෙන් ඉවත් කිරීම ප්‍රතික්ෂේප කරමින් අධ්‍යක්ෂවරයා විසින් ගනු ලැබූ තීරණයට එරෙහිව අමාත්‍යවරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමේ අයිතිය එකී අයිතිකරු සතු වේ. මේ උපවගන්තිය යටතේවූ අභියාචනයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ තීරණය අවසානාත්මක සහ තීරණාත්මක වන්නේය.

(8) යම් පාසලක කළමනාකරුවකු පත් කිරීම, විශ්‍රාම ගැනීම හෝ ඔහු ධුරයෙන් ඉවත් කිරීම, අධක්ෂවරයා විසින් සෑම විටම ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් නිවේදනය කළ යුතුය.

(9) යම් පාසලක ගුරුවරයකුගේ හෝ යම් පාසලකින් යම් ලාභයක් නැතහොත් පාරිශ්‍රමිකයක් ලබන කිසිදු තැනැත්තකු ඒ පාසලේ කළමනාකරු වශයෙන් පත් නොකළ යුතුය.

(10) යම් තැනැත්තකු :-

(අ) කළමනාකරු වශයෙන් දරණ ධුරය අධ්‍යක්ෂවරයා විසින් අත්හිටුවන ලැබීමෙන් හෝ ඔහු ධුරයෙන් ඉවත් කරනු ලබීමෙන් පසු තම ධුරය අතහැරීම ඒ තැනැත්තා ප්‍රතික්ෂේප කරයි නම් හා කළමනාකරු වශයෙන් හෝ කළමනාකාර ධුරයේ වැඩ බැලීමට හෝ නීත්‍යානුකූලව පත් කරනු ලැබූ යම් තැනැත්තකුට පාසලට ඇතුලුවීමට හෝ කළමනාකරු වශයෙන් තම කාර්ය ඉටු කිරීමට බාධා කරයි නම් හෝ ප්‍රතිරෝධය දක්වයි නම්

(ආ) (9) වන උප වගන්තියේ විධි විධාන කඩකරමින්

කළමනාකරුවකු ලෙස ක්‍රියා කරයි නම්:

එවැනි සෑම තැනැත්තකුම වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමෙන් පසු ඒ වරද කරගෙන යන සෑම දිනයක් සඳහා රුපියල් සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් වන්නේය.

## 4 වන කොටස

## පළාත් අධ්‍යාපන මණ්ඩලය

11. (1) ප්‍රධාන ඇමැතිවරයාගේ අනුමැතිය සහිතව ඇමැතිවරයා විසින් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ඇතුලුව නියෝජිතයන් 5 කට නොඅඩු 7 කට නොවැඩි සාමාජිකයන්ගෙන් සමන්විත පළාත් අධ්‍යාපන මණ්ඩලයක් බස්නාහිර පළාත සඳහා පිහිටුවනු ඇත. ප්‍රතිෂ්ඨාපනය

(2) මෙම නියෝජිත මණ්ඩලයෙන් එක් නියෝජිතයකු සභාපති ලෙස ඇමැතිවරයා විසින් නම් කරනු ඇත. මණ්ඩලයේ කාර්යයන්

ඇමැතිවරයා නම් කරන අමාත්‍යංශයේ නිලධාරියකු ලේකම් ලෙස කටයුතු කරනු ඇත. මණ්ඩලයේ සභාපති පූර්ණකාලීන සාමාජිකයකු ලෙස කටයුතු කරනු ඇත. ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් සමග සාකච්ඡා කර සේවකයන් නැවත පුහුණු කිරීමේ කටයුතුවලදී ඇමැතිවරයාට සහය වීම හා උපදෙස් දීම උදෙසා එක් සාමාජිකයකු ඇමැතිවරයා විසින් පත් කරනු ඇත.

12. (1) අධ්‍යාපනයට අදාල වන හා අධ්‍යාපන පහසුකම් සපුරාදීමට අදාළ වන කටයුතුවලදී හෝ ඇමැතිවරයා විසින් උපදෙස් උදෙසා මණ්ඩලයට යොමු කරන කටයුතුවලදී හෝ ඇමැතිවරයාට ඒවා පිළිබඳ උපදෙස් දිය යුතු යැයි මණ්ඩලය සිතන අවස්ථාවලදී අවශ්‍ය උපදෙස් දීම මණ්ඩලයේ කාර්ය වනු ඇත.

(2) මණ්ඩලය ඇමැතිවරයාගේ ඇරයුමක් ලේකම්ට ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුකූලව හා අධ්‍යාපන අරමුණුවලට අනුරූපව පළාත් උදෙස් තුන් අවුරුදු අධ්‍යාපන සංවර්ධන සැලැස්මක් සකස් කරන අතර, එහිදී

පහත සඳහන් අංශවල ඉලක්ක නිර්ණය කරනු ඇත.

(අ) ගොඩනැගිලි ප්‍රතිපාදනය, ක්‍රීඩා පිට්ටනි, විද්‍යාගාර, කර්මාන්තශාලා, නේවාසිකාගාර, ගුරු නිවාස සහ අනෙකුත් භෞතික සම්පත් ;

(ආ) ලී බඩු සැපයීම, උපකරණ සැපයීම, පුස්තකාල පහසුකම්, ක්‍රීඩා භාණ්ඩ සහ අනෙකුත් පහසුකම් ;

(3) පළාත් අධ්‍යාපන මණ්ඩලය පහත සඳහන් අංශවලට අදාළ වන යෝජනා ඉදිරිපත් කිරීම සහ අවශ්‍ය රෙකමදාරු කරනු ඇත.

(අ) නව පාසල් ප්‍රතිෂ්ඨාපනය.

(ආ) පාසල් ප්‍රතිසංවිධානය, උස් කිරීම, නම් කිරීම, නම් වෙනස් කිරීම හා වසා දැමීම.

(ඇ) අලුතින් පන්ති පටන් ගැනීම, වෘත්තීය හා කාර්මික පාඨමාලා උදෙසා මධ්‍යස්ථාන නිර්ණය කිරීම, නොවිධිමත් අධ්‍යාපන කටයුතු හා විදේශ භාෂාවන් ඉගැන්වීම හා ගුරුවරුන් හා නිලධාරීන් නැවත පුහුණු කිරීම පිළිබඳ කටයුතු.

(4) මෙම සැළසුමේ සංශෝධනය කළ යුතු කොටස් සංශෝධනය කිරීමෙන් හා අවශ්‍ය අවස්ථාවල වෙනස් කිරීමෙන් මෙම සැළසුම් ක්‍රියාත්මක කිරීමේ අනුමැතිය ලේකම්වරයා විසින් ලබාදෙනු ඇත. ඇතැම් වාර්ගික හෝ ආගමික කොටස්වලට එරෙහිව හෝ අපහසුකම් ඇති වන්නේ යයි ඇමැතිවරයා අදහස් කරන වැඩසටහන්වලට අනුමැතිය නොදෙනු ඇත.

(5) මණ්ඩලය කලින් කලට අධ්‍යාපන සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ ප්‍රගතිය සමාලෝචනය කළ යුතුය. ඉන්පසු අරමුණු ලඟා කර ගැනීමට ඇති අපහසුකම් මග හරවා ගැනීමේ ක්‍රම සහ විධි ඇමැතිවරයාට යෝජනා කළ යුතුය.

(6) සුවිශේෂ ව්‍යාපෘතීන්ට හා සාමාන්‍ය කාර්යයන් සඳහා පළාත් අධ්‍යාපන මණ්ඩලයට අධ්‍යාපනික ප්‍රගතිය පටන්ගෙන ආධාර ලබාගත හැක. අධ්‍යාපන ඇමැතිවරයාගේ අනුමැතිය ඇතිව මෙම මුදල් තම අභිමත පාසල් සංවර්ධන කාර්යයන් උදෙසා මණ්ඩලයට වැය කළ හැක. මෙම වැය පිළිබඳ ගිණුම් හා ලදුපත් තබා ගත යුතු වන අතර, ඒවා ඉල්ලා සිටින ඕනෑම විටකදී දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ පරීක්ෂණයට ඉදිරිපත් කළ යුතුය. මෙම ගිණුම පරීක්ෂා කර අනුමත කිරීම සෑම වාර්ෂික ගිණුම් පරීක්ෂණයකදීම කළ යුතු කර්යයකි.

13. (1) අධ්‍යාපන අධ්‍යක්ෂවරයා හැර ඕනෑම සාමාජිකයකු අභිමත ඕනෑම වෙලාවක පත්කිරීමේ බලය ඇමැතිවරයා වෙත ඇත.

නිල කාලය අස්වීම හා තනතුර හැරයාම

(2) ලිත් වර්ෂයේ අවසාන මස දිනය වූ දෙසැම්බර් තිස් එක්වන දිනට එම දිනෙන් අවසාන වන මාස 12 තුළ පැවැත්වූ රැස්වීම්වලින් හරි අඩකට හෝ එම දිනෙන් අවසාන වන කාලයේදී නියෝජිතයා රාජකාරියේ සිටි කාලය තුල පැවැත්වූ රැස්වීම් සංඛ්‍යාවෙන් හරි අඩකට නොපැමිණි අධ්‍යාපන අධ්‍යක්ෂ හැර අනෙක් ඕනෑම සාමාජිකයකු සේවය හැර ගියා සේ සලකනු ඇත. මණ්ඩලයෙන් කලින් කවර හෝ නිවාඩුවක් රැගෙන නැතහොත් අසනීප නිසා මෙම රැස්වීම්වලට සහභාගි නොවන සාමාජිකයන් කෙරෙහි මෙම නියෝගය බලනොපානු ඇත.

(3) අධ්‍යාපන අධ්‍යක්ෂ, ඇමැතිවරයා පහ කරන ලද හෝ ඉල්ලා අස්වූ සාමාජිකයන් හැර අනෙක් සියලුම සාමාජිකයන්ගේ නිල කාලය පත් කළ දින සි වසර තුනකට නැතහොත් පත් කළ දින සිට වසර තුනකට නැතහොත් පත් කරන දින ඇමැතිවරයා දැනුම් දෙන කාලයකට සීමාවේ.

(4) ඇමැතිවරයා කලින් කලට සුදුසු පුද්ගලයන් පහත සඳහන් කාර්යයන් උදෙසා පත් කරනු ඇත.

(අ) අසනීපය නිසා නැතහොත් නිවාඩු ගැනීම නිසා රැස්වීම්වලට සහභාගි විය නොහැකි පුද්ගලයන් වෙනුවට වැඩ බැලීමට,

(ආ) ඇමැතිවරයා විසින් සේවයෙන් පහ කිරීම, සේවය හැරයාම හෝ ඉල්ලා අස්වීමනිසා හිස්වන සාමාජික තනතුරේ වැඩබැලීමට,

14. (1) රැස්වීම් ගණපූර්ණය සාමාජිකයන් තිදෙනෙක් වනු ඇත. ගනපුරණය හා රැස්වීම් කාර්ය පටිපාටිය

(2) සෑම රැස්වීමකට සභාපති මුලසුන දැරිය යුතුය. සභාපතිවරයා රැස්වීමේ නොසිටින වේලාවක රැස්වීමේ සිටින අනෙක් සාමාජිකයන් තමන් අතුරෙන් කෙනෙකු මුලසුන දැරීමට තෝරා ගත යුතුය.

(3) මණ්ඩලයේ සභාපති අසනීපය නිසා හෝ වෙනත් හේතුවක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ තාවකාලික ලෙස මුලසුන කටයුතු කිරීමට අපොහොසත් වන විට ඇමැතිවරයා විසින් මණ්ඩලයේ වෙනත් සාමාජිකයකු මුලසුන හෙබවීමට පත් කරනු ඇත.

15. (1) මණ්ඩලයේ සභාපතිවරයා හා අනෙක් සාමාජිකයන් උදෙසා යම්කිසි ප්‍රතිලාභයක් ලබාදීම අමාත්‍ය මණ්ඩලයේ මුදල් කටයුතු භාර අමාත්‍යවරයාගේ අනුමැතියෙන් අධ්‍යාපන ඇමැතිවරයා විසින් තීරණය කරනු ඇත.

## 5 වන කොටස

## පෙර පාසල්

16. (1) වයස අවුරුදු පහට අඩු ළමුන්ගේ අධ්‍යාපනය උදෙසා පෙර පාසල් ප්‍රතිෂ්ඨාපනය කළ හැක. පෙර පාසල්. ඒවායේ අරමුණු හා අභිමතාර්ථ

(2) මෙම පාසල්වල සාමාන්‍ය අරමුණු සහ මූල්‍ය අභිමතාර්ථ,

(අ) මෙම වයසේ ළමුන් පෙන්වන හැකියාවන් පෝෂනය කිරීම උදෙසා ඇති අවශ්‍යතා මනාව සපුරාලීම,

(ආ) ඔවුන්ගේ ඉදිරි අධ්‍යාපනය උදෙසා ශක්තිමත් අත්තිවාරමක් ලබාදීම,

(ඇ) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති ළමුන් හෝ සාමාජික, මානසික හෝ හැගීම් දුබලතා ඇති ළමුන්හෝ මානිසක හෝ ශාරීරික ඌනතා ඇති ළමුන් හෝ හඳුනාගෙන ඔවුන්ගේ ඉදිරි අධ්‍යාපනික වැඩසටහන් සැකසීම.

(ඈ) 'ඇ' ඡේදයේ සඳහන් වන පරිදි යම් ඌණතා හෝ දුබලතා ඇති ළමුන් පිළිබඳව දෙමාපියන්ට දැනුම් දී ඒවා මගහැරීමට උදව් හා උපදෙස් දීම.

(ඉ) විශේෂයෙන් වරප්‍රසාද අඩු ප්‍රදේශවලින් පැමිණෙන ළමුන්ගේ සෞඛ්‍ය හා පෝෂණ දුබලතා නැති කර ගැනීමට ජනතා සහය ඇති කරලීම.

17. අමාත්‍යවරයා විටින් විට සාදන නියෝගතා හා මෙම ප්‍රඥප්තියට අනුකූල පෙර පාසල් ප්‍රතිෂ්ඨාපනය කරන ලෙස පළාත් පාලන බලධාරීන් හෝ පිළිගත් සංවිධාන හෝ ස්වේච්ඡා සංවිධාන හෝ උනන්දු කිරීම අමාත්‍යංශය කළ යුතු වන්නේය.

අමාත්‍යංශය මගින් පෙර පාසල් අධ්‍යාපනය උනන්දු කිරීම

18. අනෙක් අවස්ථාවල අධ්‍යාපනය ලබාදෙන වෙනත් පාසලක් සමග පෙර පාසලක් පවත්වාගෙන යාම හෝ එවැන්නක් සමග ඒකාබද්ධව පෙර පාසලක් පරිපාලනය කිරීම නොකළ යුත්තකි.

වෙනමම ඒකකයක් ලෙස පෙර පාසල් පවත්වාගත යුතු බව

මෙම නියෝග බලාත්මක වීමට පෙර සිට ප්‍රාථමික හෝ ද්විතියික අධ්‍යාපනය දෙන පාසලකට අනුබද්ධව තැබූ පෙර පාසලක් වෙනමම සංවිධානය වන්නේ නම් වෙනමම මුල් ගුරුවරයකු යටතේ වෙනමම ඒකකයක් ලෙස පවත්වාගෙන යන්නේ නම් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ අනුමැතිය ඇතිව එකම ස්ථානයේ

පවත්වාගෙන යාම කරගෙන යා හැක.

19. අධ්‍යාපන අධ්‍යක්ෂවරයා සියලුම පෙර පාසල් පාලකයන් හා අයිතිකරුවන්ගේ නම් හා ලිපිනය සහිත ලේඛණයක් පවත්වාගෙන යා යුතුය. ලියාපදිංචි වුවත් නැතත් එවැනි පෙර පාසලක් පිළිබඳව අවශ්‍ය යැයි සිතෙන ඕනෑම තොරතුරක් ලබා ගැනීමේ බලය අධ්‍යාපන අධ්‍යක්ෂවරයාට ඇත. පෙර පාසල් ලේඛණය

(1) නිර්දිෂ්ඨ දිනට පසුව ඕනෑම පළාත් නිලධාරියකු පිළිගත් සංවිධානයක් ස්වේච්ඡා සංවිධානයක් නැතහොත් කණ්ඩායමක් හෝ පුද්ගලයකු අධ්‍යාපන අධ්‍යක්ෂගේ පූර්ව අනුමැතිය මෙම ප්‍රඥප්තිය හෝ නියෝග අනුව නොලබා පෙර පාසලක් පිහිටුවීම නීතිවිරෝධී වන්නේය. පෙර පාසල් පරීක්ෂණය හා ලේඛණගත කිරීම

(2) අමාත්‍යවරයා නියම කරන කාලයක් තුළ ප්‍රතිෂ්ඨාපනය කර ඇති පෙර පාසල් ලේඛණ ගත කරනු ඇත.

(3) (අ) ගැසට් පත්‍රයේ පළ කරන අවසාන දිනය ඉකුත්වීමට පෙර සෑම පෙර පාසලකම අයිතිකරු හෝ කළමනාකරු තම පෙර පාසල ලේඛණගත කරන ලෙස අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉල්ලුම් කළ යුතුය. පෙර පාසලක් අලුතින් ඇරඹීමට යෝජිත අවස්ථාවක එය පිහිටුවීමට දින 39 කට පෙර තම අභියාචනය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත දැනුම් දිය යුතුය.

(ආ) මෙම අයදුම්පතේ පහත සඳහන් කරුණු සඳහන් කළ යුතුය.

i. පෙර පාසල පැවැත්වීමට අපේක්ෂිත ස්ථානය, නැතහොත් ලිපිනය :-

ii. පාසල් කාමරවල භූමි වර්ග ප්‍රමාණය :-

iii. අපේක්ෂිත ශිෂ්‍ය සංඛ්‍යාව :-

iv. සෑම උපගුරුවරයකුගේම නම හා සුදුසුකම් සහ ගෙවීමට යෝජිත පඩි ක්‍රමය :-

v. පෙර පාසල ඇරඹීමට යෝජිත දිනය :-

vi. පාසල පවත්වාගෙන යාමේදී භාවිතා කරන මාධ්‍යය හෝ මාධ්‍යයන් :-

vii. පාසලේ පාලක තැනගේ නැතහොත් අයිතිකරුගේ නම සහ ලිපිනය :-

viii. අධ්‍යාපන අධ්‍යක්ෂවරයාට අවශ්‍යවේ යැයි හැගෙන වෙනත් තොරතුරු වෙතොත් එය :-

(4) (අ) ඕනෑම වේලාවක පෙර පාසලකට ඇතුලුව එය පරීක්ෂණය කිරීමේ බලතල අධ්‍යාපන අධ්‍යක්ෂකට හෝ ඔහු බලය පැවරූ වෙනත් නිලධාරියකුට ඇත.

(ආ) අධ්‍යාපන අධ්‍යක්ෂකට පෙර පාසල් අයදුම්පත් තාවකාලික ලෙස ලේඛණගත කර පෙර පාසල ඇරඹූ පසු පරීක්ෂණය කිරීමේ විධි විධාන යෙදිය යුතුය.

(ඇ) පරීක්ෂණයෙන් පසුව ඉඩකඩ අපහසුකම්, සෞඛ්‍ය පහසුකම්වල අඩුපාඩු ගුරු හිඟ හා උපකරණ අඩුපාඩු ඇති බව සොයා ගතහොත් අධ්‍යාපන අධ්‍යක්ෂ මෙම අඩුපාඩු දන්වන ආකාරයට සෑහෙන කාලසීමාවක් තුළ දී මග හරවාලන ලෙස පෙර පාසල අයිතිකරුට හෝ කළමනාකරුට ලිඛිතව දන්වනු ඇත.

(ඈ) දෙවැනි පරීක්ෂණයේදී පෙර පාසල නිසි ලෙස උපකරණවලින් යුක්ත බවද, සතුටුදායක බවද දැනගතහොත් තාවකාලික ලේඛණ

ගත කිරීම ස්ථිර කරන අතර, එය අයිතිකරුට හෝ කළමනාකරුට දන්වනු ඇත.

21. පෙර පාසලක කළමනාකරුට හෝ අයිතිකරුට එහි අඩුපාඩු සහ ඌනතා පිළිබඳව දක්වා ඇති අවස්ථාවක දෙවැනි පරීක්ෂණයක් යොදාගත හැකි වන අතර, එම දෙවැනි පරීක්ෂණය උදෙසා වැය වන මුදල කළමනාකරු හෝ අයිතිකරු හෝ ගෙවිය යුතුය. මෙම මුදල නිසි ආකාරයට ගෙවූ පසු දෙවැනි පරීක්ෂණය පවත්වා පරීක්ෂණ වාර්තාව සකස් කළ යුතුය. දෙවැනි පරීක්ෂණයේ ගාස්තු අයිතිකරු නැතහොත් කළමනාකරු ගෙවිය යුතු බව

22. අධ්‍යාපනය අධ්‍යක්ෂවරයාගේ අදහසට අනුව දෙවැනි පරීක්ෂණයෙන් පසු පෙර පාසල පැවතිය යුතු තත්ත්වයේ හා මට්ටමේ නොතිබේ යැයි අවබෝධ වේ නම් එම පෙර පාසලේ තාවකාලික ලේඛණ ගත කිරීම අවලංගු කරන ලෙස අධ්‍යාපන අධ්‍යක්ෂවරයා නියෝග කරනු ලබන්නේය. තාවකාලික ලේඛණගත කිරීම අවලංගු කිරීම

## 6 වන කොටස

## සාමාන්‍ය විධි විධාන

23. (1) බස්නාහිර පළාත තුළ පාසලක් ආරම්භ කිරීමට හෝ තමන් විසින් කලින් පාවිච්චි නොකරන ලද යම් පන්ති කාමරයකදී හෝ පාඨමාලා ගොඩනැගිල්ලකදී පාසල් යන වයසේ ළමයින්ට සිංහල, දෙමළ හෝ වෙනත් භාෂාවකින් අධ්‍යාපනය ලබාදීම සඳහා පන්තියක් හෝ පන්ති පැවැත්වීමට අපේක්ෂා කරන යම් තැනැත්තකු විසින් එකී යෝජිත අධ්‍යාපන පන්ති පැවැත්වීම ආරම්භ කිරීමට යටත් පිරිසෙයින් මාස දෙකකට කලින්, තම අධ්‍යාංශය පිළිබඳව ලිඛිත දැන්වීමක් අධ්‍යක්ෂවරයා වෙත යවමින් ඒ පාසල හෝ අධ්‍යාපන පන්ති පිළිබඳ විස්තර ඒ තැනැත්තා විසින් අධ්‍යක්ෂවරයා වෙත සැපයිය යුතු අතර, ඉන් පසු පැවැත්වීමට ඒ තැනැත්තා අදහස් කරන පාසල හෝ පන්තිය හෝ පන්ති සහ අධ්‍යාපන පාඨමාලා සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරයා විසින් නියම කරනු ලබන විස්තර ඔහු විසින් අධ්‍යක්ෂවරයා වෙත සැපයිය යුතුය. නව පාසලක් ආරම්භ කරන පුද්ගලයකුගේ යුතුකම අධ්‍යාපන අධ්‍යක්ෂට දැනුම් දීම බව

එසේ වුවද යට කී මාස දෙකක කාල පරිච්ඡේදය තුළදී දෙන ලද දැන්වීමක් භාර ගැනීම හෝ විධාන කිසිවක් කිරීම හෝ යම් අවස්ථාවකට අදාළ විශේෂ පරිවේෂණ අනුව යට කී දැන්වීම

සම්බන්ධයෙන් වූ මේ වගන්තියේ නියමයන් අත හැරීම අධ්‍යක්ෂවරයා විසින් කරනු ලැබිය හැකිය.

(2) ඉහත (1) වන උප වගන්තිය යටතේ දෙනු ලැබූ දැන්වීමකට අදාළ යම් පාසලක් හෝ අධ්‍යයන පාඨමාලාවක් අනුමත කිරීම ස්වකීය අභිමතය පරිදි, අධ්‍යක්ෂවරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය.

(3) ඉහත (1) වන උප වගන්තියේ විධි විධාන කඩකරමින් යම් පාසලක් ආරම්භ කරන හෝ යම් අධ්‍යයන පාඨමාලාවක් පවත්වන යම් තැනැත්තකු මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන අතර, මෙම වරද කරන එක දිනකට රුපියල් 500 ට නොවැඩි දඩයකට යටත් වන්නේය.

ආධාර නොලබන පාසල්වලට අදාළ විස්තර පිළිබඳ නිවේදන

24. (1) ආධාර නොලබන පාසල් සම්බන්ධයෙන් තමා වෙත සැපයිය යුතු යයි අධ්‍යක්ෂවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින් නියම කරනු ලබන පරිදි, ආධාර නොලබන යම් පාසලකට අදාළ සියලු විස්තර, ඒ පාසලේ විදුහල්පති හෝ ඒ පාසල තත් කාලයේ භාරව සිටින තැනැත්තා විසින් අධ්‍යක්ෂවරයා වෙත ලිඛිතව දැනුම්දී ඇත්නම් මිස, කිසිදු තැනැත්තකු විසින් ආධාර නොලබන පාසලක් පවත්වා ගෙන නොයා යුතුය.

(2) (1) වන උපවගන්තිය කඩ කරමින්යම් පාසලක් පවත්වාගෙන යනු ලැබුවහොත්, එහි අයිතිකරු විදුහල්පති හෝ තත්කාලයේ එහි පාලනය භාරව සිටින තැනැත්තා වරදකට වරදකරු වන අතර, ඔහු වරදකරු කරනු ලැබීමෙන් පසු රුපියල් පන්සියයකට නොවැඩි දඩයකටද ඒ වරද දිගටම කගෙන යනු ලබන්නේ නම් එසේ ඒ වරද කරනු ලබන එක් එක් දිනය සඳහා සියයකට නොවැඩි තවදුරටත් වූ දඩයකටද ඒ තැනැත්තා යටතේ වන්නේය.

25. (1) අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ ඔහු සුවිශේෂ ලෙස හෝ සාමාන්‍ය ලෙස බලය පැවරූ දෙපාර්තමේන්තු නිලධාරියකුට හෝ පුද්ගලයකුට ඕනෑම දෙපාර්තමේන්තු නිලධාරියකුට හෝ පුද්ගලයකුට ඕනෑම පාසලකට ඇතුල් වී

එම පාසල පරීක්ෂණයකට භාජනය කිරීම, එම පාසලේ ශිෂ්‍යයන් ගැන සොයා බැලීම, සිසුන් ඇතුළත් කිරීමේ හා පැමිණීමේ ලේඛණ පරීක්ෂා කිරීම, පාසල පරීක්ෂා කිරීම නීත්‍යනුකූල වනු ඇත. විදුහල්පති හා වෙනත් නිලධාරීන් එසේ පැමිණෙන අධ්‍යක්ෂවරයාට හෝ ඔහුගේ නියෝජිත නිලධාරියාට තම පරීක්ෂණය විභාගය කරගෙන යාමට පූර්ණ සහයෝගය දිය යුතුය.

(2) ආධාර නොලබන පාසලක් මේ වගන්තිය යටතේ පරීක්ෂා කරනු ලැබීමෙන් පසු

.අසතුටුදායක ලෙස පවත්වාගෙන යනු ලබන ආධාර නොලබන පාසල් වසා දැමිය යුතු බව

(අ) ඒ පාසලට පැමිණෙන ශිෂ්‍යයන් සංඛ්‍යාව, වයස් සහ ස්ත්‍රී පුරුෂ භාවය සැලකිල්ලට ගැනීමේදී ඒ පාසලේ සපයා ඇති ඉඩ පහසුකම් ප්‍රමාණවත් නොවන බව හෝ නුසුදුසු බව හෝ

(ආ) පාසලේ සපයා ඇති සෞඛ්‍ය පහසුකම් ප්‍රමාණවත් නොවන බව හෝ

(ඇ) පාසලට පැමිණෙන ශිෂ්‍යයන්ගේ වයස් සහ ස්ත්‍රී පුරුෂ භාවය සැලකිල්ලට ගැනීමේදී කාර්යක්ෂමවූත්, සුදුසුවූත්, අධ්‍යාපනයක් ඒ පාසලෙන් ලබා නොදෙන බව හෝ

(ඈ) ඒ පාසලේ අයිතිකරු හෝ යම් ගුරුවරයකු අවස්ථාවට උචිත පරිදි එසේ අයිතිකරු වශයෙන් හෝ ගුරුවරයකු වශයෙන් ක්‍රියා කිරීමට නුසුදුසු තැනැත්තකු බව හෝ

(ඉ) ඒ පාසලෙහි ලබාදෙන අධ්‍යාපනය ජාතියේ යහපතට හෝ අධ්‍යාපනය මාධ්‍යය පිළිබඳ ප්‍රතිපත්තිය ඇතුලුව අධ්‍යාපනය පිළිබඳව ආණ්ඩුවේ හෝ බස්නාහිර පළාතේ පළාත් සභාවේ සාමාන්‍ය ප්‍රතිපත්තියට සපලාකාරයෙන් අනුකූල නොවන බව,

අධ්‍යක්ෂවරයා සෑහීමකට පත් වුවහොත් පහත දැක්වෙන කරුණු

ඇතුළත් නියමයන් ඒ පාසලේ අයිතිකරු වෙත භාර දෙනු ලැබීමට අධ්‍යක්ෂවරයා විසින් කටයුතු සැලැස්විය යුතුය.

i චෝදනාවට ලක්වූ කරුණු සම්පූර්ණයෙන් සඳහන් කරමින් සහ ඒවාට ප්‍රතිකර්ම යෙදීම සඳහා අවශ්‍ය පියවර නියම කරමින්,

ii එකී පියවර ගත යුත්තේ කුමන කාලයක් ඇතුළත දීද යන්න, එනම්, නියමය භාරදී මාස 6 කට නොඅඩු කාලයක් නියම කරමින් සහ,

iii එකී කාලය ඇතුළතදී එකී පියවර නොගනු ලැබුවහොත් එකී කාල පරිච්ඡේදය අවසානයේදී නොපමාවම පාසල වසා දැමිය යුතු බව නියම කරමින්,

(3) එවැනි නියමයකට විරුද්ධව මෙහි පහත දක්වා ඇති පරිදි වූ අභියාචනයක් ඉදිරිපත් කළ යුතු කාලය, කවරේදැයි මේ වගන්තිය යටතේ භාර දෙනු ලබන සෑම නියමයක්ම සඳහන් විය යුතුය. එහෙත් එකී කාලය එකී නියමය භාර දෙනු ලැබීමෙන් පසු මසකට නොඅඩු කාලයක් විය යුතුය

26. 25 වන වගන්තියේ (2) වන උප වගන්තිය යටතේ නියමයක් භාර දෙනු ලැබූ ආධාර නොලබන පාසලක අයිතිකරු විසින් ඒ නියමය විරුද්ධව ලිඛිත අභියාචනයක් 27 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ අභියාචන මණ්ඩලය වෙත, තත් කාර්ය සඳහා යට කී නියමයෙන් ඉඩ දී ඇති කාලය තුළදී ඉදිරිපත් කරනු ලැබිය හැකිය. අභියාචනය ඉදිරිපත් කරන්නේ යම් නියමයකට විරුද්ධවද ඒ නියමයේ සාරය සහ අභියාචනය කරන්නේ කවර හේතු මතද යන්න එවැනි සෑම අභියාචනයකම අඩංගු විය යුතු අතර, එය 'අභියාචන මණ්ඩලයේ සභාපති' වෙත පිට නම ලියා යට කී කාලපරිච්ඡේදය තුළදී අධ්‍යක්ෂවරයාට ලැබෙන සේ අධ්‍යක්ෂවරයා වෙත යැවිය යුතුය. 25 වන වගන්තිය යටතේ වූ නියමයට විරුද්ධ අභියාචන

27. (1) 26 වන වගන්තිය යටතේ වූ අභියාචන විභාග කොට තීරණය කිරීම සඳහා අභියාචන මණ්ඩලයක් සංස්ථාපිත කිරීමේ කාර්ය පිණිස ආණ්ඩුකාරවරයා විසින් පත් කරනු ලබන තැනැත්තන් පස් දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවකින් සමන්විත වූ මූල මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතුය. අභියාචන මණ්ඩල

(2) යම් පාසලක කළමනාකරණයට කෙළින්ම හෝ අන්‍යාකාරයකින්

සම්බන්ධව සිටින තැනැත්තකු හෝ නෛතික හෝ අධ්‍යාපනික පළපුරුද්දක් නොමැති තැනැත්තකු I වන උපවගන්තිය යටතේ වූ මූල මණ්ඩලයට පත්කරනු ලැබීමට සුදුසු නොවේ. එකී මූල මණ්ඩලයට පත් කරනු ලැබූ සෑම තැනැත්තකුම කලින් තම ධුරයෙන් ඉල්ලා අස් වන්නේ නම් හෝ ආණ්ඩුකාරවරයා විසින් ඔහු ධුරයෙන් ඉවත් කරනු ලබන්නේ නම් මිස, ඔහු පත් කිරීමේදී ආණ්ඩුකාරවරයා විසින් නිශ්වය කරනු ලබන කාල පරිච්ඡේදයක් සඳහා එකී ධුරය දැරිය යුතුය. කාලය ඉකුත්වීම හේතු කොටගෙන ධුරය හිස් කරන යම් තැනැත්තෙක් මූල මණ්ඩලයට නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙක් වේ.

(3) එකී මූල මණ්ඩලයේ සාමාජිකයන් අතුරෙන් අමාත්‍යවරයා විසින් තෝරා ගනු ලබන තැනැත්තන් තිදෙනෙකුගෙන් සෑම අභියාචන මණ්ඩලයක්ම සමන්විත විය යුතු අතර, ලේකම්වරයා විසින් එය කැඳවනු ලැබිය යුතුය. එකී අභියාචන ලේකම්වරයා විසින් එය කැඳවනු ලැබිය යුතුය. එකී අභියාචන මණ්ඩලයක සාමාජිකයන් විසින් තමන් අතුරින් කෙනෙකු එකී සභාපතිවරයා ලෙස පත්කර ගත යුතුය. එවැනි අභියාචන මණ්ඩලයක් වෙත යොමු කරනු ලැබූ යම් කරුණක් සම්බන්ධයෙන් එකී සාමාජිකයන්ගේ බහුතරයෙන් ගනු ලබන තීරණය ඒ මණ්ඩලයේ තීරණය වන්නේය.

(4) 26 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලැබූ සෑම අභියාචනයක්ම මේ වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ අභියාචන මණ්ඩලයක් වෙත ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂවරයාගේ කාර්ය වන්නේය.

(5) අභියාචන මණ්ඩලයක් වෙත යම් අභියාචනයක් (4) වන උප වගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලැබූ විට, එම කරුණු ඉදිරිපත් කිරීමට

වස්ථාවක් අභියාචකයාට සහ අධ්‍යක්ෂවරයාට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට සලස්වා දීමෙන් පසු සහ ඔවුන් විසින් නැතහොත් ඔවුන් වෙනුවෙන් ඉදිරිපත් කරනු ලැබූ සාක්ෂි සලකා බැලීමෙන් පසු පහත දැක්වෙන අන්දමේ නියමයක් අභියාචන මණ්ඩලය විසින් කරනු ලැබිය හැකිය.

(අ) අභියාචනය කරන ලද්දේ යම් නියමයකට විරුද්ධවද ඒ නියමය නිශ්ප්‍රභ කරන ලද බව.

(ආ) ඒ නියමය අදාළ වන ආධාර නොලබන පාසල විසින් ඒ නියමයෙහි සඳහන් නියම කිරීම, අභියාචන මණ්ඩලය විසින් නියමයක් කරනු ලබන යම් මඳ වෙනස් කිරීම්වලට යටත්ව සහ එසේ නිශ්චය කරනු ලබන කාලයක් තුළදී ඉටු කරනු ලැබුවහොත් මිස ඒ පාසල වසා දැමිය යුතු බව.

28. ආධාර නොලබන යම් පාසලක් වසා දැමීමට 25 වන වගන්තිය යටතේ කරනු ලැබූ නියමයකට එරෙහිව 26 වන වගන්තිය සහ 27 වන වගන්තිය යටතේ අභියාචනයක් ඉදිරිපත් නොකොට ඒ නියමයෙහි නිශ්චිතව සඳහන් කළ පරිච්ඡේදය ඒ නියමය නොපිළිපැද ඇති අවස්ථාවකදී, ඒ පාසලේ අයිතිකරු වරදකට වරදකරු වන අතර, රුපියල් පන්සියයක දඩයට යටත් වේ. ඔහු වරදකරු කරනු ලැබූ පසු වරද නැවත කරගෙන යනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් පන්සියයකට නොවැඩි අතිරේක දඩයකට ඔහු යටත් වෙයි.

ආධාර නොලබන පාසලක් වසා දැමීමට කරනු ලැබූ නියමයක් නොපිළිපැදීම වරදක් බව

29. (1) මේ පනත යටතේ වූ හෝ මේ පනත යටතේ සාදන ලද නියෝග යටතේ වූ සියලු වැරදි සම්බන්ධයෙන් වන නඩු විභාග, මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් හෝ යම් වරදක් සිදුකර ඇත්තේ යම් චූලයාචනාධිකරණයක අධිකරණ බල සීමාව තුළ නම් ඒ චූලයාචනාධිකරණය විසින් පැවැත් විය යුතුය.

වැරදි සම්බන්ධයෙන් අධිකරණ බලය

(2) වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇතද, යම් වරදක් සඳහා මේ ප්‍රඥප්තියෙන් හෝ මේ ප්‍රඥප්තිය යටතේ නියමිත උපරිම දණ්ඩනය, නිසි අධිකරණ බලය ඇති චූලයාචනාධිකරණයක් විසින් පනවනු ලැබීය හැකිය.

30. (1) යම් මහේස්ත්‍රාත් අධිකරණයක අධිකරණ බල සීමාව තුළ පාසල් යන වයසේ වූ යම් ළමයකු පාසල් යාම යුක්ති සහගත හේතුවක් නොමැතිව සිරිත් වශයෙන් නොසලකා හැර තිබේ නම් හෝ සිරිත් වයෙන් නිසි පාලනයකින්

සහතික කළ පාසලකට ළමයකු ඇතුලු කිරීමට ඇතැම් අවස්ථාවලදී මහේස්ත්‍රාත්වරයා සතු බලතල

තොරව වීථිවල සංචාරය කරන්නේ නම් හෝ දුෂ්චරිත ගත කරන නැතහොත් අසාධු තැනැත්තන් සමග හෝ ප්‍රකට අපරාධකරුවන් සමග හැසිරේ නම් නියමිත නිලධරයා විසින් ඒ ළමයාට සහ ඔහුගේ දෙමාපියන් සොයාගත හැකි නම් ඔවුන්ට අවවාද කිරීමෙන් පසු මහේස්ත්‍රාත්වරයා වෙත ලිඛිත වාර්තාවක් ඉදිරිපත් කිරීම ඒ නියමිත නිලධරයාගේ කාර්යය වන්නේය.

(2) එවිට මහේස්ත්‍රාත්වරයා විසින් ඒ ළමයා සහ (සොයාගත හැකි නම්) ඔහුගේ දෙමාපියන් තමා ඉදිරියට කැඳවිය යුතු අතර, යට කී වාර්තාවේ අඩංගු කරුණු සම්බන්ධයෙන් මහේස්ත්‍රාත්වරයා සෑහීමට පත් වන්නේ නම්, ළමයින් සහ තරුණයන් පිළිබඳ ආඥාපනත යටතේ අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන (මෙහි මින් මතු ,අනුබල කල පාසල, යනුවෙන් සඳහන් කරනු ලබන) යම් පාසලකට හෝ ආයතනයකට, සුදුසුයැයි ඒ මහේස්ත්‍රාත්වරයා විසින් සලකනු ලබන කාලයකට (එකී ආඥාපනතේ නියමිත සීමා කිරීම්වලට යටත්ව) ඒ ළමයා යවන ලෙස මහේස්ත්‍රාත්වරයා විසින් ආඥා කරනු ලැබිය හැකිය.

31. මේ ප්‍රඥප්තිය යටතේ හෝ ඒ යටතේ සාදනු ලැබූ නියෝග යටතේ අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය පහත දැක්වෙන විධි විධාන අදාළ විය යුතුය. කාර්ය පරිපාටිය

i දණ්ඩනයක් නියම කරනු වෙනුවට ඒ ළමයා පාසල් යායුතු බවට ආඥාවක් විසින් කරනු ලැබිය හැකි අතර, ඉන්පසු පාසල් යාම ඒ ළමයා විසින් පැහැර හරිනු ලැබුවහොත් ඒ ළමයා පාසල් යැවීම පහැර හැරීමට වගකිවයුතු තැනැත්තාට රුපියල් 500 කට නොවැඩි දඩයකින් දඬුවම් කරනු ලැබිය හැකිය.

ii පාසල් යායුතු කාලවේලාවලදී පාසල් යාමට නියම කරනු ලැබූ ළමයකු නමින් ඉදිරියට පමුණුවන ලෙස මහේස්ත්‍රාත්වරයා විසින් හෝ චූලයාචනාධිකරණයේ විනිශ්චයකාරවරයා විසින් ඒ ළමයාගේ දෙමවුපියන්ට නියම කරනු ලැබිය හැකි අතර, යුක්ති සහගත හේතුවක් නොමැතිව සිතාසිවලට අනුකූලව ක්‍රියා කිරීම යම් දෙමවුපියකු විසින් පැහැර හරිනු ලැබුවහොත් (එකී යුක්ති සහගත

හේතු ඔප්පු කිරීම ඔහු සතු කාර්යයක් වන්නේය) ඔහු වරදකට වරදකරු වන අතර, එය මහේස්ත්‍රාත්වරයා හෝ චූලයාචනාධිකරණයේ විනිශ්චයකාරවරයා ඉදිරියේදී පවත්වන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රු. 200 කට නොවැඩි දඩයකට ඔහු යටත් වන්නේය.

iii මේ කාර්ය පරිපාටිය සඳහා නියමිත වයසේ යම් ළමයකු සිටින බව පෙනෙන විට ඒ ළමයාගේ වයස එසේ නොවන බව ඔප්පු කිරීම විත්තිකරු සතු වේ.

iv යම් ළමයකු යම් අධ්‍යාපන මට්ටමක් ලබා ගෙන තිබෙන බව හෝ සුදුසු සහ ප්‍රමාණවත් අධ්‍යාපනයක් ඒ ළමයාට ලැබෙන බව හෝ නොලැබෙන බව හෝ යම් පාසලකින් ප්‍රමාණවත් සහ සුදුසු අධ්‍යාපනයක් ලබා තිබෙන බව හෝ ලබා නොතිබෙන බව ප්‍රකාශ කරමින් අධ්‍යක්ෂවරයාගේ අත්සන යටතේ වූ හෝ අධ්‍යක්ෂවරයා විසින් බලය දෙනු ලැබූ දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකුගේ අත්සන යටතේ වූ සහතිකයක් වශයෙන් සලකනු ලබන සහතිකයක් එහි අඩංගු කරුණු සම්බන්ධයෙන් ප්‍රමාණවත් සාක්ෂි වන්නේය.

32. (1) යම් නිලධරයකු හෝ සේවකයකු පත් කිරීම, මරු කිරීම, සේවයෙන් අස් කිරීම හා විනය පාලනය 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 32 වන වගන්තිය සහ මින්මතුවට සිදුවන සංශෝධනවලට අනුකූලව සිදු කළ යුතුය.

නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, මාරු කිරීම, විනය පාලනය සහ අස්කිරීම

(2) පළාත් අධ්‍යාපන අමාත්‍යංශයේ ලේකම්ගේ ඉල්ලීම පිට රාජ්‍ය සේවයේ යම් නිලධරයකු ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය පවරනු ලැබූ අමාත්‍යවරයාගේ භාරයේ ඇති අමාත්‍යංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව, අවස්ථාවෝචිත පරිදි පළාත් අධ්‍යාපන අමාත්‍යංශයේ හෝ ඉල්ලීම කරන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයට එවැනිම කැමැත්ත ඇතිව කරනු ලබන කාලයක් සඳහා තාවකාලික වශයෙන් පත් කිරීම හෝ එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත් කිරීම හෝ කරනු ලැබිය හැකිය.

(3) යම් රාජ්‍ය නිලධරයකු පළාත් අධ්‍යාපන අමාත්‍යංශයේ කාර්ය මණ්ඩලයට තාවකාලික වශයෙන් පත් කරනු ලබන අවස්ථාවක ඔහු එසේ ඒ කාර්ය මණ්ඩලයට තාවකාලික වශයෙන් පත්කරනු ලැබූ වේලාවේදී රාජ්‍ය සේවයෙහි ඔහුගේ ස්ථිර තනතුර විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් වශයෙන් ප්‍රකාශ කරනු ලැබූ තනතුරක් නම් :-

i ඔහු ඒ පළාත් අධ්‍යාපන අමාත්‍යංශයේ සේවයෙහි නියුක්ත කරනු ලැබ ඇති අතරතුර, රාජ්‍ය ප්‍රතිපත්තිය මත වැටුප් රහිතව දෙන ලද නිවාඩු පිට රාජ්‍ය සේවයේ රාජකාරිය සඳහා නොපැමිණි ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒ ව්‍යවස්ථා සංග්‍රහයේ 10 (1) වන වගන්තිය ඔහුට අදාළ විය යුතුය, සහ

ii ඔහු පළාත් අධ්‍යාපන අමාත්‍යංශයේ සේවයෙහි නිවයුක්තව සිටින සෑම සම්පූර්ණ මාසයක් සඳහා මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන රාජ්‍ය සේවයෙහි ඔහුගේ ස්ථිර තනතුරෙහි ඔහුට ගෙවනු ලැබිය යුතු වැටුපෙන් සියයට විසිපහක් නොඉක්මවන මුදලක් ඒ අමාත්‍යංශය විසින් ඔහු සම්බන්ධයෙන් මණ්ඩලයේ අරමුදලින් ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදලට බැර කරනු පිණිස මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාට ගෙවිය යුතුය, සහ

iii ඔහු පළාත් අධ්‍යාපන අමාත්‍යංශයේ කාර්ය මණ්ඩලයට තාවකාලික වශයෙන් පත් කරනු ලැබූ අවස්ථාවේදී, ඔහු රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් ආඥාපනත යටතේ පිහිටුවන ලද රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලෙහි දායකයකුව සිටියේ නම් පළාත් අධ්‍යාපන අමාත්‍යංශයට ඔහු විසින් කරනු ලබන සේවය, ඒ ආඥාපනතේ කාර්ය සඳහා ආණ්ඩුවට කරනු ලබන සේවයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒ ආඥාපනත යටතේ ගෙවීමට ඔහු යටත් වන දායක මුදල් ඔහු ඒ අමාත්‍යංශයේ සේවයෙහි නියුක්ත කරනු ලැබ සිටින අතරතුර, රාජ්‍ය සේවා අර්ථසාදක අරමුදලට නොකඩවා ගෙවිය යුතුය. තවද එක් එක් මුදල් වර්ෂය අවසානයේදී ඒ අමාත්‍යංශයේ අරමුදල්වලින් ඔහු සම්බන්ධයෙන් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට ආණ්ඩුව යටත්වන දායක මුදලට සමාන මුදලක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ උචිත ගිණුමට බැර කිරීම සඳහා මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාට ඒ අමාත්‍යංශය විසින් ඔහු සම්බන්ධයෙන් ගෙවනු ලැබිය යුතුය.

(4) යම් රාජ්‍ය නිලධරයකු පළාත් අධ්‍යාපන අමාත්‍යංශයේ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත් කරනු ලබන අවස්ථාවක :-

(අ) ඔහු රාජ්‍ය සේවයෙන් අස්වූ ලෙස සලකනු ලැබිය යුතුය,

(ආ) ඔහු ඒ අමාත්‍යංශයේ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත් කරනු ලැබූ වේලාවේදී, රාජ්‍ය සේවයෙහි ඔහුගේ ස්ථිර තනතුර විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් ලෙස ප්‍රකාශ කරනු ලැබූ තනතුරක් වූයේ නම් -

i එකී අමාත්‍යංශයේ කාර්ය මණ්ඩලයට ඔහු ස්ථිර වශයෙන් පත් කරනු ලැබූ දින අසනීපයක් හේතු කොට ගෙන රාජ්‍ය සේවයෙන් ඔහු විශ්‍රාම ගන්වනු ලැබ තිබිණි නම් ඔහුට ගෙවනු ලැබිය හැකිව තිබූ ප්‍රදානයක් ලැබීම ඒ අවස්ථාව සංග්‍රහය යටතේ ඔහුට සුදුසුකම් ඇත්තේය.

ii වයස නිසා හෝ අසනීපයක් නිසා හෝ ඔහු විසින් ඒ කාර්ය මණ්ඩලයෙහි දරණ ලද තනතුර අහෝසි කිරීම නිසා හෝ කැබිනට් මණ්ඩලයේ මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද වෙනත් යම් හේතුවක් නිසා හෝ අමාත්‍යංශයේ කාර්ය මණ්ඩලයෙහි ඔහුගේ සේවා නියුක්තිය, විශ්‍රාම ගැන්වීමෙන් අවසන් කරනු ලැබුවහොත් මිස, ඒ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ කරනු ලබන යම් ප්‍රදානයක සඳහන් මුදල් ප්‍රමාණය ඔහුට ගෙවනු නොලැබිය යුතුය, තවද,

(ඇ) ඒ අමාත්‍යංශයේ කාර්ය මණ්ඩලයට ඔහු ස්ථිර වශයෙන් පත්

කරනු ලැබූ අවස්ථාවේදී ඔහු රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනත යටතේ පිහිටුවන ලද රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ දායකයකුව සිටියේ නම් ඔහු සේවයෙන් පහ කිරීමෙන් නොව, ආණ්ඩුවේ කැමැත්ත ඇතිව ගිවිසුම අවසන් වීමෙන් පසු ආණ්ඩුවේ සේවය අත්හරිනු ලැබූ ලෙස ඒ ආඥාපනතේ කාර්යය සඳහා සලකනු ලැබිය යුතුය.

(ඈ) යම් නිශ්චිත කාලයක් සඳහා ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වෙමින් ආණ්ඩුව සමග ගිවිසුමකට එළඹ ඇති තනැත්තකු පළාත් අධ්‍යාපන අමාත්‍යංශය විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන අවස්ථාවක ඒ තැනැත්තා විසින් ඒ අමාත්‍යංශයට සේවය කරනු ලබන යම් සේවා කාලයක් ඒ ගිවිසුමේ බැඳීම ඉටු කිරීමේ කාර්යය සඳහා ඇාණ්ඩුවට කරනු ලබන සේවයක් සලකනු ලැබිය යුතුය.

33. පළාත් අධ්‍යාපන අමාත්‍යංශයේ සියලුම නිලධරයන් සහ සේවකයන්, දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රාජ්‍ය නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතුය.

නිලධරයන් සහ සේවකයන් නිලධරයන් බව

34. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛණ ගත ආයතනයක් වන අතර, ඒ පනතේ විධි විධාන ඒ අනුව අදාළ විය යුතුය.

අධ්‍යාපන උපලේඛණ ආයතනයක් බව

35. (1) මේ ප්‍රඥප්තියේ විධි විධාන බලාත්මක කිරීමේ කාර්ය සඳහා බස්නාහිර පළාත වෙනුවෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකිය.

(2) විශේෂයෙන්ම සහ (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා වෙත පැවරුන බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව ශ්‍රී ලංකාවේ ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ 9 වන උප වගන්තියේ 1 වන ලැයිස්තුවේ iii වන පරිශිෂ්ඨයේ හා 3 වන ලැයිස්තුවේ 2 සහ 3 අංක යටතේ සඳහන් කරුණු සියල්ලම හෝ ඉන් කිසිවක් සඳහා අමාත්‍යවරයා විසින් නියෝග පැනවිය හැකි අතර iii වන ලැයිස්තුවේ 2 සහ 3 අංක යටතේ සඳහන් කරුණු සඳහා නියෝග සෑදීමේදී 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ xvii අ

පරිච්ඡේදයේ 145 උ. (5) ආ අනුව  කටයුතු කරනු ලැබිය හැක.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම බස්නාහිර පළාත් සභාව අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එසේ අනුමත නොකරන ලද නියෝග පරිච්පින්න වූ සේ සැලකිය යුතුය. එසේ පරිච්පින්න කරන ලද නියෝග / නියෝගය ගැසට් පත්‍රයේ පල කළ යුතුය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක්ම බස්නාහිර පළාත් සභාව අනුමත කොට ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු එම නිවේදනය ගැසට් පත්‍රයේ පළ වූදිනයේ හෝ එම නිවේදනයේ සඳහන් දිනයේ සිට ක්‍රියාත්මක විය යුතුය. ඇමැතිවරයා සැකසූ පළාත් සභාව අනුමත කොට ගැසට් පත්‍රයේ පළවූ නියෝගයක් ක්‍රියාත්මක වූවා සේ වලංගු වන අතර ක්‍රියාත්මක කලසේ සැලකේ.

36. මේ ප්‍රඥප්තියේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය නොවන්නේ නම් :- අර්ථ නිරූපනය

(1) අයිතිකරු :

යම් පෞද්ගලික පාසලක් සම්බන්ධ අයිතිකරු යනු අධ්‍යාපන අධ්‍යක්ෂගේ පිළිගැනීම අනුව පාසලක් පවත්වාගෙන යාමට බලය ඇති පුද්ගලයකු හෝ පුද්ගලයන් කීප දෙනෙකුගේ මණ්ඩලයක් වේ. මෙම අයිතිකරුට පාසල පවත්වාගෙන යන ගොඩනැගිලි හා ඒවා අවට පිහිටි භූමියේ නීතිමය අයිතිය හෝ එම අයිතිය ඇති අයගේ පැවරුමකින් බලය ලැබීම නිසා මෙම ගොඩනැගිලි තුළ පාසලක් පවත්වාගෙන යාමේ නීතිමය අයිතිය තිබිය යුතුවේ.

(2) කළමනාකරු :

ආධාර ලබන පාසලක කළමනාකරු යනු එම පාසලේ ගුරුවරු හා අනෙක් නිලධාරීන් පත් කිරීම, මාරු කිරීම හා වැඩ නැවැත්වීම ආදිය කරන පුද්ගලයාය.

(3) අමාත්‍යවරයා :

'අමාත්‍යවරයා' යන්නෙන් බස්නාහිර පළාතේ අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරුන් අතුරින් අධ්‍යාපන විෂය පවරනු ලැබූ අමාත්‍යවරයා අදහස් වේ.

(4) ආධාර නොලබන පාසල :

රජයේ නොවන පාසලකි. ආධාර ලබන පාසලක්ද නොවේ.

(5) නියමිත නිලධාරියා :

අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නිලධාරියකු නැතහොත් අධ්‍යාපන අධ්‍යක්ෂ බලය පැවරූ නිලධාරියකු හෝ ග්‍රාම නිලධාරී අදහස් කෙරේ. මෙම නිලධාරියාට 30 වන ඡේදයේ අඩංගු විධි විධාන ක්‍රියාත්මක කිරීමේ බලතල පවරා තිබිය යුතුය.

(6) දෙමාපියන් :

'දෙමාපියන්' යන්නට යම් ළමයකුගේ භාරකරුවකු සහ නීත්‍යනුකූල භාරකාරත්වය හෝ සැබෑ පාලනය දරන්නකි හෝ ළමයාගේ වැටුප්වලින් කෙලින්ම ප්‍රතිලාභ ලන්නකු ඇතුළත් වේ.

(7) පාසල් යන වයස :

'පාසල් යන වයස' යන්නෙන් ජාතික අධ්‍යාපන අමාත්‍යංශය විසින් නියම කරනු ලබන වයස් සීමාවන් අදහස් වේ. 1 වන ඡේදයේ දෙමාපිය යන්නට දී ඇති අර්ථකථනය අදාළ නැත.

(8) රජයේ පාසල :

'රජයේ පාසල' යන්නෙන් මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මකවීම ආරම්භ වීමට පෙර හෝ ඉන් පසුව හෝ සම්පූර්ණයෙන්ම නැතහොත් අර්ධ වශයෙන් රජයේ අරමුදල්වලින් පිහිටුවනු ලැබූ සහ සම්පූර්ණයෙන්ම රජයේ මුදල්වලින් නඩත්තු කරනු ලබන පාසලක් අදහස් වේ.

(9) ආධාර ලබන පාසල :

රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් මූල්‍යමය ආධාර ලබාදෙන පාසලකි.

(10) රජයේ අරමුදල් :

පාර්ලිමේන්තුව විසින් අධ්‍යාපන ආඥාපනත හා/හෝ මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම උදෙසා දෙන ලද මුදලය.

(11) පළාත් අරමුදල :

මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම උදෙසා පළාත් අධිකාරිය විසින් දෙන මුදල වේ.

මෙම ප්‍රඥප්තිය 1990.10.31 දින රැස්වූ බස්නාහිර පළාත් සභා රැස්වීමේදී සභා සම්මත වූ බව මෙයින් සහතික කරමි.